# නොදන්නා සංස්කෘතික විප්ලවය

චීනයේ ජීවිත සහ ගම්මාන වල වෙනස්වීම

*1966-1976 දක්වා චීනයේ ශ්‍රේෂ්ඨ නිර්ධන පංතික සංස්කෘතික විප්ලවයට (GPCR-Great Proletarian Cultural Revolution) ලෝක ජනගහනයෙන් හතරෙන් එකක් දායක වුණි. එය නිදහස උදෙසා වූ අරගලය මානව ඉතිහාසයේ නොදුටු ඉහළ තලයකට ගෙන ගියහ. නමුත් අද චීනයේ සංස්කෘතික විප්ලවය ගැන ජනතාවට ඇහෙන දේවල් පටු අසත්‍යයන්ය. මෙය ලියන ඩොන්පිං හෑන් (Dongping Han) වැඩුණේ ශ්‍රේෂ්ඨ නිර්ධන පංති සංස්කෘතික විප්ලවය සමයේදීය. ''නොදන්නා සංස්කෘතික විප්ලවය-චීනයේ ජීවිත සහ ගම්මාන වල වෙනස්වීම'' නැමැති පොතේ කතුවරයාද ඔහුය. ඔහුගේ කථාව සංස්කෘතික විප්ලවයේ සත්‍යය දැන ගැනීමට සුබදායී දායකත්වයක් සපයයි. 2008 දෙසැම්බර් මාසයේදී, විප්ලවය පොත්, සත්‍ය වාර්තා ගැලපීමේ ව්‍යාපෘතිය, සහ නිව්යෝර්ක් පුස්තකාලයේ මහජන දැනුම පිළිබඳ ආයතනයේ අනුග්‍රහයෙන් පැවති ''චීන සංස්කෘතික විප්ලවය යළි සොයා ගැනීම: කලාව සහ දේශපාලනය, ජීවමානවූ අත්දැකීම්, විමුක්තියේ උරුමයන්'' යන ඉතා වැදගත් කතිකාවට ඩොන් පින් හෑන් සහභාගි වුණි. 2008 දෙසැම්බර් 12 වන දා, කතිකාවතේ ආරම්භක දින රාත්‍රී ඩොන්පින් හෑන් විප්ලවය පොත් හලේදී කථා කළේය. බායි ඩයි (Bai Di) ද, මෙම කතිකාවේදී කථා කළ අතර ඇය ද සංස්කෘතික විප්ලවය කාලයේදී හැදී වැඩුණු අතර ඈ සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාවක් revcom.us වෙබ් අඩවියෙන් ලබා ගත හැක.*

*පහත දැක්වෙන්නේ ඩොන්පින් හෑන් ගේ කථාවේ සංස්කරණය කළ පිටපතයි.*

මගේ පොත සංස්කෘතික විප්ලවය සමයේ චීන අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ පිළිබඳවය. මම විප්ලවය සමග ජීවත් වූ අයෙක් වෙමි. මම චීනයේ සමූහ ගොවිපළවල වැඩුණු අයෙක්මි. මම අවුරුදු නවයෙහිදී ගොවිපළේ වැඩ කරන්න පටන් ගතිමි. ඒ දිනවල චීනයේ පාසැල් දින දෙකක් සහ හවස් වරු දෙකකුත්, ඉරිදා දිනයකුත් ළමුන්ට ගොවිපළ වල වැඩ කිරීම සඳහා වසා දමති. එම නිසා පාසැලේ ඉදිමින්ම මම දින දෙකක් වැඩ කළෙමි. සමූහ ගොවිපළ වලින් ළමුන්ගේ වැඩ සඳහා වැඩ ලකුණු* ලැබුණි. වැඩිහිටියන් හට දිනක වැඩ සඳහා වැඩ ලකුණු 10 ක් ලැබුණි. ගොවිපළේ වැඩ කරමින් මම හැම දිනයකම වැඩ ලකුණු 5.7 ක් ලබා ගත්හ. එලෙස වයස නවයේදීම මට විප්ලවයට දායක වන්නට ඉඩ ලැබුණි. සෑම කෙනෙකුටම ගොවිපළේ වැඩ කරන්න පුළුවන් වුණි. ඔබට වැඩ කරන්න ඕනෑ වුනි නම් හැම විටම රැකියාවක් ලැබුණි. ඒ දිනවල මගේ රැකියාව ඉතා පහසු එකකි. උදාහරණයක් ලෙස වැඩිහිටියො වගාවලට ගඟෙන් වතුර රැගෙන එන අතර මම පැළවලට වතුර දැමුවෙමි.

මගේ පොතෙන් මම විග්‍රහ කරන්නේ සංස්කෘතික විප්ලවයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ පිටිසරබද පෙදෙස් වල ඒ පිළිබඳ ආකල්පයන් පිළිබඳවයි. මගේ තරුණ කාලයේදී ගමේ හිටිය බොහෝ පුද්ගලයින් නූගත් උදවියයි. මගේ දෙමව්පියොත් නූගත් අයයි. චීන කොමියුනිස්ට් පක්ෂය බලයට ඒමට පෙර චීනයේ බොහෝ ගොවීන් පාසැල් යාමට තරම් හැකියාවක් නොමැති ලෙසට දිළිඳු අයයි. වයස අවුරුදු 12 දී ම මගේ පියා පූර්ණකාලීනව කර්මාන්තශාලාවක වැඩ කිරීම අරඹා ඇත. මගේ මව ගමේ තිබුණු එම්බ්‍රොයිඩර් වැඩ පළක වැඩ කිරීම අරඹා තිබුණේ ඇයට වයස අවුරුදු 6 ක් වන විටයි. එනිසා ඔවුනට කිසිම අධ්‍යාපනයක් ලැබී නැහැ. මට ඥාති සහෝදර සහෝදරියන් පස් දෙනෙක් විය. මම වැඩෙන විට ගමේ මට වඩා වයසින් වැඩි බොහෝ දරුවන්ට පාසැල් යාමට නොහැකි වුණා. මගේ ඥාති සහෝදරයන්ට සහ මගේ වැඩිමහල් සහෝදරියටද පාසැල් යාමට නොහැකි වුණා.

චීන කොමියුනිස්ට් පක්ෂයට ගැමි ජනතාව උදෙසාවූ අධ්‍යාපන ක්‍රමයක් උරුමව තිබුණි. ගමේ දරුවන්ට පාසැල් යෑම ඉතා දුෂ්කර වුණි. මම පළවන පන්තිය පටන් ගන්නා විට, විභාගයක් සමත් වීමට තිබුණා. දරුවන්ට පාසැල් යාමට අවශ්‍ය නම් පාසැලට යාමට පෙර ලිවීමේ හැකියාව ලබා ගැනීම අවශ්‍ය වුණා. එපමණක් නොවෙයි 100 ට ගණන් කිරීමේ හැකියාව ලබා ගත යුතුව තිබුණා.

නමුත් බොහෝ දෙමාපියන්ට ඔවුන්ගේ දරුවන් හට මේ ටික ඉගැන්වීමට දක්ෂතාවයක් නොතිබුණ බැවින් ඔවුනගේ ළමුන් පාසැල් වලට නොතේරුණි. ප්‍රතික්ෂේප වුණි. ගම්බද පාසැල් වල අවශ්‍ය ප්‍රමාණයට ඉඩ කඩ නොතිබුණ බැවින් මෙම කාලයේදී පාසැලට ඇතුලත් වීමේ විභාගය අවශ්‍ය විය. නමුත් වසර තුනක් ඇතුළත, සංස්කෘතික විප්ලවය සමයේදී, මගේ පළාතේ හැම ගමකම ප්‍රාථමික පාසැලක් ඇරඹීමට කටයුතු යෙදුණා. ඒ කාලයෙහි මගේ පළාතේ ගම්මාන 1050 ක් තිබුණා. සංස්කෘතික විප්ලවයේ වසරක් ඇතුලත සෑම ගමකම පාසැලක් ඇරඹුණා. පාසැල් යන වයසේ සෑම ළමයෙක්ම නොමිලේ අධ්‍යාපනය ලැබීම සඳහා පාසැල් වලට ඇතුළු වුණා. අද චීන රජය සහ චීන රජයට පක්ෂපාත කොටස් චීන සංස්කෘතික විප්ලවය සමයේ පැවති චීන අධ්‍යාපනය විනාශකාරී යැයි පවසනව. මෙය ඉතා සරල මිත්‍යාවකි.

සංස්කෘතික විප්ලවයේ දසවන වසරේදී චීනයේ ගම්බද අධ්‍යාපනය දියුණුවට පත් වුණා. සෑම ගම්මානයකම පාසැල් 4 ක් එකතු කර ඒකාබද්ධ මධ්‍ය විද්‍යාල ඇති කළා. එම නිසා ප්‍රාථමික අධ්‍යාපනය හොඳින් ලබාගත් සෑම ළමයෙක්ම ඇතුළත් වීමේ විභාගයකින් තොරව මධ්‍ය විද්‍යාල වලට ඇතුලත් කර ගන්නා ලදි. ඕනෑම කෙනෙකුට ඒවාට ඇතුල්වීමට ඉඩ කඩ ලැබුණු අතර අධ්‍යාපනය මුලුමනින්ම නොමිලේ විය. මගේ පළාතේ කොමියුනයේ උසස් අධ්‍යාපනය සඳහා පාසැල් 4ක් තිබුණි. සංස්කෘතික විප්ලවයට පෙර උසස් අධ්‍යාපනය සඳහා තිබුණේ එක් උසස් අධ්‍යාපන ආයතනයකි. එහිද තිබුණේ පන්ති දෙකක් පමණි. 1950-1966 දක්වා වූ 17 වසර තුළ එම උසස් අධ්‍යපන ආයතනය

උපාධිධාරීන් 1500 ක් බිහි කළේය. 800 ක් අධ්‍යාපන ආයතනයට ගියත් ආපසු නොපැමිණියේය. ඉතිරි 700 ක් දෙනා රජයේ සේවයේ යෙදුණි නැතිනම් හමුදාවට බැදුණි. උසස් අධ්‍යාපනය සාර්ථකව නිමකළ කිසිවෙක් බිහි නොවුණි.

1972 දී මම කොමියුනයේ උසස් පාසැලට ඇතුලුවන විට මගේ පාසැලේ මගේ වයසේ ළමුන් 1000 පමණ සිටියා. මම පාසැලෙන් සමත් වන විට, මගේ ගමේ පාසැලෙන් උපාධි ලැබූ ළමුන් 100 පමණ සිටියා. මෙම උපාධිධාරීහු චීනයේ පිටිසර බද පෙදෙස් සංවර්ධනය කිරීමෙහි ලා විශාල වැඩ කොටසක් ඉටු කරන ලදි. ඔවුන්හට ඔවුන්ගේ වැඩිහිටියන් ඉටු කර තිබුණාට වඩා වැඩි වැඩ කොටසක් චීනය වෙනුවෙන් ඉටු කරන්න ලැබුණි.

සංස්කෘතික විප්ලවයට පෙර අපි ගොවිතැනෙහි පමණක් යෙදුණෙමු. සංස්කෘතික විප්ලවය සමයේ උසස් අධ්‍යාපන ආයතනයේ උපාධි ලද අය ගමේ ආර්ථිකය දියුණු කිරීමට උපකාර කළා. උසස් පාසැලේ උපාධිධාරීන්ගෙන් සැදුම් ලත් වන ජීව කණ්ඩායමක් අපට තිබුණි. ඔවුන් විවිධ වර්ගයේ පළතුරු, ගම්මිරිස්, සහ වෙනත් ගස් වර්ග වගා කළහ. අප විසින් කර්මාන්ත ශාලාවක්ද ගොඩ නගන ලදි. පුද්ගලයෝ 175 දෙනෙක් එහි සේවයෙහි නිරත විය. අද චීනයේ ගම්බද තරුණයන්ට රැකියා සොයා නගරයට පැමිණීමට සිදුව ඇත. නමුත් සංස්කෘතික විප්ලවය සමයේ, අපට කොහේවත් යාමට සිදු වුණේ නැත. අපි කිසිවෙක් තව අයෙකුගේ වහලෙකු නොවීමු. අපි අපේ අනාගතය සඳහා වැඩ කළෙමු. කර්මාන්තශාලාවේ වැඩ කළ 175 දෙනා සාමූහිකව ඉපයුවා. එය ගොවීන්ගේ ජීවිත සංවර්ධනය කරන ලදි.

කර්මාන්ත ශාලාව ගමට අවශ්‍ය කෘෂි උපකරණ නිපදවීය. අපට ට්‍රැක්ටර් දෙකක් සහ පිකප් රථ දෙකක් තිබුණි. ආපසු හැරී බැලූ විට මට හිතෙනව, නිෂ්පාදනය ඉහළ ගිය නිසා සංස්කෘතික විප්ලවයේ අවුරුදු වලදී ගොවීන්ගේ ජීවිත සෑම අංශයකින්ම උසස් සංවර්ධනයක් අයත් කර ගත් බව. මේ දස වර්ෂය තුළදී මගේ රටේ ධාන්‍ය අස්වැන්න දෙගුණයකට වඩා ඉහළ නැංග අතර ආදායම ද දෙගුණයකටත් වඩා ඉහළට නැගුණි. නමුත් ධනේශ්වර චීන රජය ප්‍රකාශ කළේ චීන ආර්ථිකය ප්‍රපාතයකට ඇද වැටුණු බවයි. මේවා අර්ථ ශූන්‍ය ප්‍රලාපයන් වෙති.

චීන රජය සමූහ ගෙවි පොළවල් විසුරුවා හැර ඔවුන්ගේ අයිතියට පවරා ගැනීමට ගොවියන්ගෙන් විමසූ විට මගේ ප්‍රදේශයේ ගොවියෝ ඊට දැඩි විරෝධයක් දැක්වීය. රජය සමූහ ගොවි පළවල් විසුරුවා හැරීම සඳහා මගේ ප්‍රදේශයේ සියලු ජනපද රාජ්‍ය නායකයින් ඉවත් කරගත්තා. මගේ ගමේ තිබුණු සියළුම දෑ පෞද්ගලීකරණය වුණේ නැහැ. නමුත් ගමේ සියලු ඉඩම් ටික රජය මිළ දී ගත්තා. ජනයා එයට එරෙහි වුණා. ඔවුන් අපේ ඉඩම් ගත්තා නම් අපේ ඉඩම්වලට වෙනත් ප්‍රදේශවල ඉඩම් වලින් වන්දි ගෙවන්න ඔවුන්ට සිදු වුණා. එනිසා අපට අපේ ඉඩම් නැති වුණේ නැහැ. ගම්වල තවම ඒවා තමන්ගෙ විදියට යොදා ගන්න ඉඩම් තිබෙනවා. ගම් වැසියෝ ඒවායෙ තවම හොඳින් කටයුතු කරනවා. ගොවීන්ට අද විශ්‍රාම ගැනීමට හැකියාව ලැබී තියෙනවා. මගේ අම්ම තවම සමූහ ගොවිපළෙන් සෑම මාසයකම විශ්‍රාම දීමනාවක් ලබනවා. අනෙක් ප්‍රදේශවල පෞද්ගලික දේපලවුණු ඉඩම්වල ගොවීන් තවමත් දැඩි දුෂ්කරතාවයන්ගෙන් පීඩා විඳිනවා.

1986 දී මම චීනයේ ග්‍රාමීය ප්‍රදේශ පර්යේෂණය කිරීමේ ඇමෙරිකානු පර්යේෂණ කණ්ඩායමට සම්බන්ධ වුණෙමි. එහි ඇමෙරිකානු විශේෂඥයින් දෙදෙනෙක් සහ මා සේවයෙහි නිරත විය. අපි හුනාන් වල (Hunan) ගම්මාන කීපයකට ගියා. ඒ වකවානුවේ ග්‍රාමීය ප්‍රදේශ වල විදේශිකයෙක් දැකීම දුර්ලභ විය. එනිසා අප යන යන තැන අප පසුපස විශාල ජනතාවක් සිටියා. විශේෂයෙන් තරුණ කාන්තාවෝ සහ පිරිමි විය. ඔවුන්ට විදේශිකයෙක් මොන වගේ දැයි දැන ගැනීමට අවශ්‍ය වුණා.

එක දවසක් මම දිවා ආහාරය ගන්නා විට, මම තරුණ ළමයි කීප දෙනෙකුට පත්තරයක ශීර්ෂ පාඨ කීපයක් කියවන්නැයි කීවෙමි. එහෙත් ඔවුහු සිය හිස වැනුවා පමණි. මා මුලදි සිතුවේ ඔවුහු ලජ්ජාවෙන් එසේ කරනු ඇති යන්නයි. සමහර ළමයි කිව්ව ඔවුන් පාසැල් ගොස් නැති බව. මට එය ඇසීම අති විශාල වේදනාවක් ගෙන දුන්නා. කොමියුනය විසුරුවා හැරිය දා සිට සියලු අධ්‍යාපන ආයතන, සියලු සෞඛ්‍ය ආයතන කොමියුනය සමගම නැතිව ගොස්ය. මම සංස්කෘතික විප්ලවය සමයේ තිබුණ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන සිතන්න පටන් ගත්තා.

1988 දී මම වැඩි දුර අධ්‍යාපනයට සිංගප්පූරුව වෙත පිටත් වුණෙමි. එතැනින් ඇමෙරිකාවේ ඉගනීම සඳහා ශිෂ්‍යත්වයක් මට ලැබුණි. ඇමෙරිකාවේ විදේශ ප්‍රතිපත්තිය සහ රාජ්‍යතන්ත්‍රික සබඳකම් වල ඉතිහාසය ඉගෙන ගැනීම මගේ අදහස විය. ඇමෙරිකාවේදි මම චීන විප්ලවය පිළිබඳව එහි උගතුන් ලියූ දෑ කියෙව්වෙමි. ඔවුන් ලියා තිබුණේ මා අත්දුටු චීන විප්ලවය පිළිබඳව නම් නොවෙයි. ඔවුන් චීනය ගැන ලියා තිබූ දේවල් ගැන මම විමතියට පත්වුණෙමි. ඇමෙරිකාවේ සිදුවන දේවල් ගැන දැඩි ලෙස කණගාටුවට පත් වුණෙමි.

මම මුලින්ම ඇමෙරිකාවට ආව විට ඇමෙරිකාව කොයි වගේද යන්න දැන නොසිටියෙමි. චීනයේ සිටි ඇමෙරිකානු ගැති වූ අය කී පරිදි අසා තිබුණේ ඇමෙරිකාව පුදුම සහගත දියුණු රටක් ලෙසයි. මම ඇමෙරිකාවේ, වර්මොට් (V ermont) හි බර්ලින්ටන් (Burlington) පෙදෙස්හි මුලින්ම ජීවත් වුණෙමි. එය චැම්ප්ලේන් වැව අසල පිහිටි ලස්සන ස්ථානයක් විය. මම නගරයේ උතුරු පෙදෙසේ දිළිඳු අසල්වැසියන් සමග ජීවත් වුනෙමි. මගේ අසල්වැසි නිවසේ ළමයි හැම වෙලාවෙම බඩගින්නෙ තමයි හිටියෙ. හැමදාම පාසැල නිමවී ආවාම, ඔවුහු මගේ පුතා සමග සෙල්ලම් කරන්න මගේ නිවසට පැමිණෙති. ඔවුන්ට බඩගිනියි කියල ඔවුහු කියති. එවිට මම ඔවුන්ට චීන පාන් කැබැල්ලක් කන්නට

දෙන්නෙමි. මට ඇමෙරිකාව දැකීම විශාල කම්පනයක් ගෙන දෙයි. ලෝකයේ ධනවත්ම රට එයයි. ඒත් කුසගින්නේ ඉන්න ජනතාව මෙහේ සිටිති. මම මෙහි වසර දෙකක් ජීවත් වුණෙමි.

ඉන් පසු මම බොස්ටන් නගරයට පැමිණ එහි සිටි පොහොසත් මිනිසුන් සමග ජීවත් වන්නට පටන් ගතිමි. එක දවසක් මගේ නිවාස හිමිය මගෙන් ඇහුව, ඇමෙරිකාව ගැන ඔබට හිතෙන්නෙ මොකද්ද? මට කිසිම හැඟීමක් නැති බව ඔහුට කී විට මගේ අදහසින් ඔහු කළබල වුණි. ඊට හේතුව ඔහු මගෙන් විමසුවා; ''චීනයේ ඉන්න විට අපි හරි දුප්පත්, එත් අපිට නිවාස නැති මිනිස්සු හිටියේ නැහැ. සමාජවාදය යටතේ හැම කෙනෙකුටම රැකියාවක් ලැබුණා. හැම කෙනෙකුටම නිදහස් අධ්‍යාපනය නිදහස් සෞඛ්‍ය පහසුකම් තිබුණා. නමුත් ලෝකයේ පොහොසත්ම රටේ මේව නැහැ.'' මම කීවෙමි. මගේ නිවාස හිමිය හිතුවෙ මගේ අදහස් වල (දර්ශනයේ)ගැටලුවක් ඇති බවයි.

1949 දී චීන විප්ලවය සාර්ථක වූ විට කොමියුනිස්ට් නිලධාරින් සිතුවේ විප්ලවය පිළිබඳ කටයුතු කරල ඔවුන් අපහසුතාවයෙන් පසුවෙන බවයි. දැන් විප්ලවය සාර්ථකයි. දැන් ඔවුන්ගේ ජීවිත සතුටින් ගත කිරීමට කාලයයි. ඔවුහු ඔවුන්ගේ ළමයි සඳහා විශේෂ පාසැල් හදල තිබුණා. චීනයේ සමාජවාදය ගොඩ නැගුවත් චීනයේ පංති ස්වභාවය ඉතා බලවත්. ඉහළ නිලධාරීන්හට විශේෂ වරප්‍රසාද තිබුණා.

සංස්කෘතික විප්ලවය යනු විප්ලවය තුළම පොදු ජනතාවට සැබෑ බලය ලබා දීමේ විප්ලවයයි. එමගින් චීනයේ නියම සමාජවාදය බිහි කිරීම ඇරඹීමයි. රුසියාවේ සිදු වුණු දෙය චීනයේ සිදු නොවීමට වග බලා ගැනීමේ ක්‍රියාවලියයි. ඒ කාලය තුළ සියලු චීන නිලධාරීන්ට වැඩ කරන ජනතාව සමග එකට වැඩ කිරීමට සිදු වුණා. ශිෂ්‍යයින්, ගුරුවරුන්, මහාචාර්යවරුන් ශාරීරික ශ්‍රමය යොදා වැඩ කිරීම කළ යුතු වුණා. මම කර්මාන්තශාලාවේ කළමනාකාරයා වීමි. මට කර්මාන්තශාලාවේයේ අනෙක් අය වැඩ කර උපයනවාට වඩා වැඩි වැටුපක් ගෙව්වේ නැහැ. පාසැල් ගුරුවරුන්ට ගෙව්වේත්, වැඩ බිම් වල වැඩ කරන අයට ගෙවන පඩියමයි. සෙරෙප්පු සපත්තු නොපැළඳූ වෛද්‍යවරුන්ටද** ගෙවන ලද්දේ එකම වැටුපකි. එහෙමයි සමාජවාදය යටතේ ක්‍රියාත්මක වුණේ. අපට එහෙම ක්‍රියාවලියක් තියේ නම් අපට දැන් තිබෙන ආකාරයේ මූල්‍යමය දියවී යෑමක් (කඩා වැටීමක්) ඇති වන්නේ නැහැ.

පසුගිය සති කීපයේ ඇමෙරිකාවේ මූල්‍ය අර්බුදයක් ඇති වුණා. මගේ ශිෂ්‍යයො බොහොම දෙනෙක් ඒ ගැන කම්පනයට පත් වුණා. මේ අවස්ථාව ඉතා වැදගත් බව මම ඔවුන්ට කිවෙමි. අපි නොසැලකිලිමත් ලෙස දිගු කාලයක සිට පරිභෝජනය කරන්නෙමු. එය නැවතීමට දැන් අපට කාලයයි. අප මෙලෙස ජීවත් විය යුතු නැහැ. නිවාස නැතිව අප වේදනා විඳිය යුතු නැහැ. මේ සමාජයෙ අපට ඕනෑ තරම් දේවල් තියෙනව. හැම කෙනෙකුටම යැපීමට ප්‍රමාණවත් තරම් නිෂ්පාදනයක් අප විසින් උපයා තිබේ. නමුත් එක් ප්‍රශ්නයක් ඇත. කෑදරකමින් පිරුණු සුළු පිරිසකට ඉන් විශාල කොටසක් අවශ්‍යව ඇත. එමනිසා අපි හැම මිනිසෙකුටම අගහිඟයක් නොමැති වෙනස් සමාජයක් ගොඩනැගිය යුත්තෙමු.

1949 දී පීඩනය සහ විදේශීය පාලනය ඉවතට වීසි කර දමමින් චීන විප්ලවය බලයට පත් විය. සභාපති මාඕ සේතුං ගේ නායකත්වය යටතේ චීන ජනතාව මුලුමනින්ම නව්‍ය වූ සමාජයක් ගොඩ නැගීම ඇරඹීය. නමුත් 1966 පංති අරගලයේදී, චීනය සමාජවාදය ගොඩ නැගීම කරා ගමන් කරාවිද, - නැවත ධනේශ්වර සමාජ ක්‍රමය ස්ථාපිත කරයිද යන මත දෙක අතිශයින් තියුණු විය. මෙය කොමියුනිස්ට් පක්ෂය ඇතුළතින් - ජනතාවට කොමියුනිස්ට්වාදය දෙසට ගමන් කිරීමට නායකත්වය දුන් ඉහළ විප්ලවීය නායකත්වය සහ චීනය නැවත ධනේශ්වර මාවත වෙතට සහ පීඩනයට නැවත ඇද දැමීමේ ප්‍රතිපත්ති ඇති අයවලුන් අතර ප්‍රකාශ විය. මේ නිසා, ධනවාදී මග ගත්තන් බිඳ හෙළීමට සහ ඔවුන් සතුව රජයේ සහ සමාජය තුළ තිබූ පාලන බලයේ කොටස් නැවත අත් පත් කර ගැනීමට මාඕ විසින් ශ්‍රේෂ්ඨ නිර්ධන පංතික සංස්කෘතික විප්ලවය දියත් කැරිණි. නමුත් එයටත් වඩා මෙය ''විප්ලවය තුළ විප්ලවයක්'' විය. එය මුළු මහත් සමජයේම දිශානතිය කොමියුනිස්ට්වාදය දෙසට හැරවීය. මාඕ සේතුංගේ ස්ථාවරය අනුව, ධනවාදී මග ගත්තන් පහ කර දැමීම සහ පොදු ජනතාවගේ සමස්ත විඥාණය, දර්ශනය සහ පුරුෂාර්ථ පරිවර්තනය කිරීම සංස්කෘතික විප්ලවයේ ඉලක්කය විය යුතුය.

ගම සහ නගරය අතර, මානසික සහ කායික ශ්‍රමය අතර, ගොවියන් සහ කම්කරුවන් අතර අසමානතාවයන් සහ වෙනස්කම් හීන කිරීමට සහ අවසානයේ ඒවා බැහැර කිරීමට අරගලය කිරීම ශ්‍රේෂ්ඨ නිර්ධන පංතික සංස්කෘතික විප්ලවයේ ඉතා වැදගත් කොටසක් විය. සමාජයේ සෑම කොටසකම පරිපාලනයට සහභාගිවීමට සහ සෘජුවම බලය සඳහා ජනතාව පුහුණු කිරීමට හැකිකම ලබා දීමට නව සහ නිර්මාණාත්මක ක්‍රමවේදයන් සොයා යෑමට සිදු කළ පුළුල් සමාජ-ව්‍යාප්ත අරගලයකි මෙය. ශ්‍රේෂ්ඨ නිර්ධන පංතික සංස්කෘතික විප්ලවය සංස්කෘතියේ, අධ්‍යාපනයේ, විද්‍යාවේ සහ වැඩ බිම්වල ''සමාජවාදී නව්‍ය දෑ'', විශ්මයට පත්කරමින් ඉදිරියට ගෙනගිය අතර ධනේශ්වර ප්‍රතිනිර්මාණය දස වසරකට නිහඬ කරවීය. නමුත් 1976 දී මාඕ මිය ගිය පසු ඩෙන්ග් ෂියාඕපිං (Deng Xiaoping) ප්‍රමුඛ කොමියුනිස්ට් පක්ෂයේ ඉහළ නායකයෝ ප්‍රතිවිප්ලවවාදී කුමන්ත්‍රණය දියත් කළහ. මාඕට සහය දැක්වූවන් සහ ඉතා ඉහළ තලයේ නායකයින් සිරගත කොට හෝ මරා දමමින් දස දහස් ගණනින් අත් අඩංගුවට ගැනීම හෝ මැඩලීම සිදු කළහ.

## සටහන්

* වැඩ ලකුණු: චීනයේ සමාජවාදී ගම්බද පෙදෙස්වල ගොවියන්ට, ආදායම බෙදී යාම සඳහන් කරන ක්‍රමයකිමෙය. සාමූහික ක්‍රමය තුළ මිනිසුන් ජීවත්වන විට සහ වැඩ කරන විට ඔවුන් විසින් සිදු කරනු ලබන වැඩ ප්‍රමාණයන්ට කිසියම් නිශ්චිත වැඩ ලකුණක් ප්‍රදානය කරන ලදි. මෙය ''හැම එකෙකුගේම හැකියාව අනුව, හැම එකෙකුගේම ශ්‍රමයට'' යන සමාජවාදී මූලධර්මයේ සුවිශේෂී භාවිතාවකි.

** පාවහන් නොපැළඳූ වෛද්‍යවරු: ශ්‍රේෂ්ඨ නිර්ධන පංතික සංස්කෘතික විප්ලවයේදී නගරවල දියුණු කරන ලද සෞඛ්‍ය පහසුකම් පිටිසර බද පෙදෙස්වලටද එලෙසින්ම කේන්ද්‍රගත කිරීම හා පිහිටුවීම සිදු කරන ලදි. ''පාවහන් නොපැළඳූ වෛද්‍යවරු'' ව්‍යාපාරය මෙම විප්ලවීය පරිවර්තනයේ කොටසක් විය. තරුණ ගොවීන්ට සහ නගරබද තරුණයින්ට මූලික සෞඛ්‍ය කටයුතු සහ බොහොමයක් පොදු රෝගාබාධ ගැන සහ නිතර මුණ ගැසෙන මූලික අවශ්‍යතාවයන්ට අවැසිවන වෛද්‍ය කර්මයන් පුහුණු කොට පිටිසරබද පෙදෙස්වලට යවන ලදි. වෛද්‍යවරු ග්‍රාමීය පෙදෙස්වලට ගියහ - දෙනු ලබන ඕනෑම වේලාවක නාගරික වෛද්‍යවරු තිදෙනෙක් ගම්බදෙහි සිටියහ. 1949 සිට 1976 දක්වා මාඕගේ නායකත්වයෙන් යුත් පාලන කාලය තුළදී වසර 32 ක් ව පැවති ආයු අපේක්ෂාව වසර 65 දක්වා දෙගුණ විය.

---

විප්ලවීය ඇමෙරිකන් කොමියුනිස්ට් පක්ෂයේ (RCP) නිළ පුවත්පත වන ''විප්ලවය'' (Revolution) හි 2009 අගෝස්තු 30 පළ වූ 174 වන කලාපයේ ලිපියකින් පරිවර්තනය කරන ලදි.

පරිවර්තනය
නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
අංක 11

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com